# 04 අක්‍රිය උපාංග සඳහා සරල ධාරා හා ප්‍රත්‍යාවර්ත ධාරා වෝල්ටීයතා යෙදීම.

ඉලෙක්ට්‍රොනික පරිපථයක භාවිත කරන උපාංග අක්‍රිය උපාංග සහ සක්‍රිය උපාංග ලෙස කොටස් දෙකකට වෙන්කළ හැකි ය. අක්‍රිය උපාංගවන ප්‍රතිරෝධක, ධාරිත්‍රක ප්‍රේරක වෙතට සරල සහ ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතා යොදුවිට ඒවා තුළින් ධාරාව ගලා යාමේ විවිධත්වය නිසා සිදුවන ආචරණ මෙම කොටසින් විස්තර වේ.

## ප්‍රතිරෝධයක් වෙතට සරල ධාරා සහ ප්‍රත්‍යාවර්ත ධාරා වෝල්ටීයතා යෙදීම.

ප්‍රතිරෝධකයක් දෙපසට සරල ධාරාව වෝල්ටීයතාවක් ලබාදුන් විට එය තුළින් ධාරාවක් ගලා යයි. එම ධාරාවේ ප්‍රමාණය ප්‍රතිරෝධයේ අගය මත රඳා පවතී. ප්‍රතිරෝධකයේ අගය අඩු නම් ගලන ධාරාව වැඩි වන අතර අගය ඉහළ නම් ගලන ධාරාව අඩු වේ. මෙහි දී ප්‍රතිරෝධය වෝල්ටීයතාව හා ධාරාව අතර පවතින සම්බන්ධය ප්‍රකාශ වේ. ඕම් නියමයෙන් නම් වේ.

### ඕම් නියමය

" උෂ්නත්වය නියතව තිබිය දී සංනායකයක් තුළින් ගලන ධාරාව, එම සන්නායකය දෙකෙළවර විභව අන්තරයට අනුලෝමව සමානුපාතික වේ. " යන්න ඕම්ගේ නියමය යි.




4.1 රූපය

**I** = ධාරාව

**V** = වෝල්ට් (වොල්ට්වලින්)

මෙහි දී නියත අගය වන්නේ සන්නයකයේ ප්‍රතිරෝධය යි. එනම් R වේ.

$$\frac{V}{I} = \text{නියතයකි (R)}$$

$$\frac{V}{I} = R$$

$$V = I.R$$

**I x R = V**

ඉහත ප්‍රකාශනය මෙසේ ලියා දැක්විය හැකි ය.

## ධාරිත්‍රයක් වෙතට සරල ධාරා වෝල්ටීයතා යෙදීම.

ධාරිත්‍රකයක් දෙපසට සරල ධාරාවක් ලබා දුන් විට ආරම්භයේ දී ක්ෂණික ධාරාවක් ගලා යයි.එනම් විසර්ජනය වූ ධාරිත්‍රකයක් දෙපසට වෝල්ටීයතාවයක් ලබාදුන් විට එය ලඝු පරිපථයක් (Short Circuit) ලෙස ක්‍රියා කරයි. එම නිසා එවැනි පරිපථයක් දෙපස වෝල්ටීයතාවයක් නොපිහිටයි. එබැවින් විසර්ජනය වූ ධාරිත්‍රකයක් ආරෝපනය ආරම්භ මොහොතේ ශුන්‍ය වෝල්ටීයතාවයක් පෙන්වයි. ඉන්පසු ක්‍රමයෙන් වෝල්ටීයතාවය වැඩි වී අවසානයේ දී ධාරිත්‍රකය සම්පූර්ණයෙන් ආරෝපණය වී වෝල්ටීයතාව උපරීම මට්ටමකට පැමිණේ. විසර්ජනයේ දී පළමුවෙන් සීඝ්‍ර වෝල්ටීයතා බැස්මක් ඇති වී පසුව ක්‍රමයෙන් ශුන්‍ය වී යයි. කාලය අනුව මෙම වෝල්ටීයතා වෙනස් වීම 4.2 ප්‍රස්තාරවලින් දැක්වේ. මේ අනුව ධාරිත්‍රකය තුළින් ගලන ධාරාව උපරිම වීමෙන් පසු වෝල්ටීයතාව උපරිම වේ.




ධාරිත්‍රකය විසර්ජනය වීම — ධාරිත්‍රකය ආරෝපණය වීම

4.2 රූපය

ධාරිත්‍රකයක් (C) ප්‍රතිරෝධයක් (R) හරහා ආරෝපණයවන විට ඒ සඳහා ගතවන කාලය කාල නියතය මත රදා පවතී. R - C ශ්‍රේණිගත පරිපථයක කාල නියතය T = RC වේ. ධාරිත්‍රකය සැපයුම් වොල්ටීයතාව දක්වා ආරෝපණය වීමට ගතවන කාලය කාල නියතයකි.

## ප්‍රේරකයක් වෙතට සරලධාරා වෝල්ටීයතාව යෙදීම

ප්‍රේරකයක් දෙපසට සරලධාරා වෝල්ටීයවක් යෙදුවිට ප්‍රේරකය තුළින් ගලායන ධාරාව සීඝ්‍රයෙන් වැඩි වී ක්‍රමයෙන් සිග්‍රතාව අඩු වී අවසානයේ උපරිම අගයකට ළඟා වේ. ප්‍රේරකයේ දෙකෙළවර ලඝු කළවිට සීඝ්‍රයෙන් ධාරාව අඩුවීම සිදු වී පසු ව සෙමෙන් ධාරාව අඩු වී ශූන්‍ය වේ.

ප්‍රේරකයක් තුළින් ගලන ධාරාව උපරිම වීමට ගතවන කාලය එහි කාල නියතය අනුව වෙනස් වේ. ප්‍රේරකය තුළ ඇති ප්‍රතිරෝධකය R නම් L ප්‍රේරතාවය නම් එහි කාල නියතය $\frac{L}{R}$ වේ. උපරිම ධාරාව දක්වා ආරෝපණයවීමට ගතවන කාලය කාල නියතයකි.




## ප්‍රතිරෝධයක් වෙතට ප්‍රත්‍යාවර්ත ධාරා යෙදවීම.

ප්‍රතිරෝධයක් දෙපසට ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතාවයන් සැපයු විට වෝල්ටීයතාව අනුව ධාරාව වෙනස් වේ. එනම් වෝල්ටීයතාව වැඩිවන විට ධාරාව ද වැඩිවන අතර වෝල්ටීයතාව අඩුවන විට ධාරාව ද අඩු වේ. ධාරාවේ හා වෝල්ටීයතාවයේ හෙවත් වෙනස්වීම 4.3 රූපයන් දැක්විය හැකි ය.




4.3 රූපය

මෙවැනි පිහිටීමකට ධාරාව සහ වෝල්ටීයතාව සම කලාවේ පිහිටීම යයි කියනු ලැබේ. මෙය දෛශික සටහනක් ලෙස 4.4 රූපයේ දැක්විය හැකි ය.




4.4 රූපය

## ධාරිත්‍රකයක් වෙතට ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතාවය යෙදීම.

සරල ධාරාවක් ධාරිත්‍රකයේ දෙපසට යෙදූ විට ධාරාව පළමුවත් ගමන් කරයි. එමෙන් ම ප්‍රත්‍යාවර්ත ධාරාවක් සැපයූ විට ද, වෝල්ටීයතාවයට පෙර ධාරාව උපරිම වේ. මෙහි දී වෝල්ටීයතාවයට වඩා ධාරාව $90^0$ කින් ඉදිරියට එන්නේ යැයි කියනු ලැබේ. මෙම සිදුවීම පහත රූපයෙන් දැක්විය හැකි ය.




4.5 රූපය

මෙහි දී වෝල්ටීයතාව හා ධාරාවේ කලා වෙනස අතර $90^0$ ක් වේ. වෝල්ටීයතාවයේ සහ ධාරාවේ හා හැසිරීම කලා රූප සටහනක් ලෙස පහත දැක්වේ.




## ප්‍රේරකයක් වෙතට ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතා යෙදීම.

ප්‍රේරකයක් වෙතට ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතාවයක් යෙදූවිට වෝල්ටීයතාවට වඩා $90^0$ ක් පසුපසින් ගමන් කරන බව තරංග සටහනින් දැක්වේ.




4.6

වෝල්ටීයතා හා ධාරා තරංග අධ්‍යයනය කළවිට වෝල්ටීයතාවයට වඩා ධාරාව $90^0$ ක් පසු පසින් පිහිටන බව පහත රූපයේ පරිදි කලා සටහනකින් දැක්විය හැකි ය.




## ධාරිත්‍රක ප්‍රතිබාධනය (Capacitive Reactance)

ධාරිත්‍රකයක් දෙපසට සරලධාරාවක් යෙදුවිට එය තුළින් ධාරාවක් ගලා නොයන බවත්, ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතාවයක් යෙදුවිට ධාරාවක් ගලායන බව ද පැහැදිලි ය.




4.7 රූපය

ඉහත පරිථයේ 12v ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතා සැපයුම සම්බන්ධ කළ පසු L පහන දැල්වේ. ඒ අවස්ථාවේ $C_1$ හා L දෙපස වෝල්ටීයතා වෙන වෙනම මැන බැලුවහොත් වෝල්ටීයතා බැස්මක් ඇති වී ඇති බව පෙනේ. පහන ප්‍රතිරෝධකයක් වන අතර ඒ තුළින් ධාරාව ගලා යාමේ දී වෝල්ටීයතා බැස්මක් ඇති වේ. නමුත් $C_1$ තුලින් ප්‍රත්‍යාවර්ත ධාරාවක් ගැලීමේ දී වෝල්ටීයතා බැස්ම ඇතිවන්නේ ප්‍රතිරෝධය නිසා නොවේ. ධාරිත්‍රකය තුළින් ධාරාව ගලා යන්නේ එය දෙපස ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතාවක් සැපයූ වීට ඇතිවන වෙනත් බාධාවක් නිසාය. එය ධාරිත්‍රක ප්‍රතිබාධනය නමින් හැඳින්වේ. මෙය ද ධාරාවේ ගමනට බාධාවක් ඇති කරණ හෙයින් ඕම්වලින් මනිනු ලැබේ.

ධාරිත්‍රක ප්‍රතිබාධනය ප්‍රත්‍යවර්ත වෝල්ටීයතාවයේ සංඛ්‍යාතය හා ධාරිත්‍රකයේ ධාරිතාව මත වෙනස් වේ. ධාරිත්‍රක ප්‍රති බාධනය පහත ප්‍රකාශනයෙන් සොයාගත හැකි ය.

ධාරිත්‍රක ප්‍රතිබාදනය $= X_C = \dfrac{1}{2\pi fc}$

f = ප්‍රත්‍යාවර්තධාරා තරංගයේ සංඛ්‍යාතය (හර්ට්ස් - $H_Z$)

c = ධාරනාව (ෆැරඩ් - f)

ඉහත ප්‍රකාශනය අනුව ප්‍රත්‍යවර්ත වෝල්ටීයතාවයේ සංඛ්‍යාතය වැඩිවන විට ධාරිත්‍රක ප්‍රතිබාධනය අඩුවන අතර, සංඛ්‍යාතය අඩුකළ විට ධාරකය ප්‍රතිබාධනය වැඩි වේ.

එසේ ම එම ප්‍රකාශනය අනුව ධාරිත්‍රකයේ ධාරනාව වැඩිවන විට ධාරිත්‍රක ප්‍රතිබාදනය අඩුවන අතර, ධාරිතාව අඩුවන විට ධාරිත්‍රක ප්‍රතිබාධනය වැඩි වේ.

## ප්‍රේරක ප්‍රතිබාදනය (Inductive Reactince)

ප්‍රේරකයක් දෙපසට සරළධාරා ජව සැපයුමක් සම්බන්ධ කළවිට එය තුළින් ධාරාව ගලායන අතර එය ප්‍රතිරෝධකයක් ලෙස ක්‍රියාකරයි. නමුත් ප්‍රත්‍යාවර්තධාරා ජව සැප-යුමක් ලබාදුන්විට ප්‍රේරණ දඟරය හරහා වැඩි බාධාවක් ඇතිවන බව පහත පරීක්ෂණයෙන් පැහැදිලි වේ.




4.8 රූපය

මෙම බාධාව ප්‍රේරක ප්‍රතිබාදනය ($X_L$) ලෙස හැඳින්වෙන අතර ඒ සඳහා භාවිත කරන ප්‍රකාශනය පහත දක්වේ.

ප්‍රේරක ප්‍රතිභාදනය ($X_l$) $= 2\pi fL$

f - ප්‍රත්‍යාවර්ත ධාරා තරංගයේ සංඛ්‍යාතය (හර්ට්ස් - $H_Z$)

L - ප්‍රේරකයේ ප්‍රේරතාව (හෙන්රි - H)